# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය
எனது இல DSD/HO/06/EP/01/චක්‍රලේඛ - 2025
My No

ඔබේ අංකය
உமது இல ........................................
Your No

දිනය
திகதி 2025.06. 04
Date

***සමෘද්ධි චක්‍රලේඛ අංක :2025/05***

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි මූලස්ථාන ,බැංකු සමිති,ව්‍යාපෘති , ප්‍රජා මූල බැංකු කළමනාකරුවන්,
සියළුම සංවර්ධන නිලධාරින්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරින්.

**සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2025.**

අස්වැසුම ප්‍රතිලාභ ලබන , සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහල නංවාලමින් තිරසරව එය පවත්වාගෙන යාමට අවශ්‍ය ව්‍යවසායකත්ව කුසලතා ප්‍රවර්ධනය කිරීම, වෙළඳපොල සඳහා ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ඉහළ ආදායමක් ලබාගැනීම, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට භාණ්ඩ හා සේවා සැපයීම මෙන්ම විධිමත් වෘත්තිය මාර්ගෝපදේශනය තුලින් රැකියා වෙළඳපොලෙහි වඩාත් ආකර්ශණීය වෘත්තියමය අවස්ථාවන් හඳුනාගැනීම සඳහා පහසුකම් සැලසීම,රැකියා ඉලක්ක කරගත් වෘත්තිය පුහුණුව ලබාදීම අරමුණු කරගනිමින් 2025 වර්ෂයේ අලෙවි සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත.

**2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්**

1.අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන.
2.රැකියා ඉලක්ක කරගත් වෘත්තිය පුහුණු වැඩසටහන.
3.ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන.
4. අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සමෘද්ධි සුව බොජුන්හල් ස්ථාපිත කිරීම.

2025 වර්ෂය සඳහා ඔබ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් හා ප්‍රතිපාදන වෙන්කිරීම ඇමුණුම - 01 මගින් දක්වා ඇත.

**1.අස්වැසුම්ලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන.**

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අ.පො.ස .(සාමාන්‍ය පෙළ),අ.පො.ස (උසස් පෙළ) විභාගයට පෙනී සිටින හා අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් පසු පාසල හැර ගිය තරුණ තරුණියන් සඳහා වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කල යුතුය. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වන්නේ


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (நுண் நிதி) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | dradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2[illegible] |
| | | Hot Line :0112-889007 | | | |

ඉලක්කගත කණ්ඩායමෙහි කුසලතාවයන් නිවැරදි විද්‍යාත්මක ක්‍රමයක් මගින් හඳුනාගැනීම හා ඔවුන්ගේ අනාගත අධ්‍යාපන හා වෘත්තිය අවස්ථාවන් සඳහා නිවැරදි මඟපෙන්වීම ලබාදීමය. මෙම වැඩසටහන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කල හැකි අතර තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවශ්‍යතාවයන් අනුව ක්‍රියාත්මක කල හැක.

I. අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා පෙනිසිටි දරුවන් සඳහා උසස්පෙළ විෂය ධාරාව තෝරාගැනීමට අවශ්‍ය උපදේශනය.
II. අ.පො.ස (උ.පෙළ) විභාගයට පෙනි සිටි දරුවන්ට උසස් අධ්‍යාපන අවස්ථා සඳහා අවශ්‍ය මඟපෙන්වීම.
III. අ.පො.ස (සා.පෙළ) හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් පසු පාසල හැරගිය තරුණ තරුණියන්ගේ කුසලතාවයන් නිවැරදිව හඳුනාගෙන අනාගතය ජය ගැනීම සඳහා අවශ්‍ය නිපුණතාවය හා ව්‍යවසායකත්ව අවස්ථා උදා කරගැනීම සඳහා ඔවුන් වෙත වෘත්තිය මාර්ගෝපදේශනය ලබාදීම.

එක් වැඩසටහනක් සඳහා අවම වශයෙන් 20 දෙනෙකු පමණ සහභාගී කරවීම වඩාත් ප්‍රායෝගික වේ. වැඩසටහන් සඳහා පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේදීද ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් කාර්යාලවල සේවයේ නියුතු <u>නිපුණතා සංවර්ධන හා මානව සම්පත් සංවර්ධන නිලධාරීන්</u> සම්පත්දායකයින් ලෙස යොදාගත යුතුවේ. මේ සඳහා භාවිතා කල යුතු වෘත්තිය යතුරේ ආදර්ශනයක් <u>ඇමුණුම - 02</u> මගින් ලබා දී ඇත. එක් වැඩසටහනක් වෙනුවෙන් සම්පත් දායකයින්ගේ සංග්‍රහ, ලිපිද්‍රව්‍ය හා අනෙකුත් වියදම් සඳහා රු.3000/= ක මුදලක් වැයකල හැක. ඔබ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහනේ ප්‍රගතිය Excel පැතුරුම්පත (Excel Sheet) යොදාගෙන <u>ඇමුණුම - 03</u> මගින් හා මාසික ප්‍රගතිය <u>ඇමුණුම - 04</u> මගින් අලෙවි සංවර්ධන අංශයට ලබා දිය යුතුය.

## 2. රැකියා ඉලක්ක කරගත් ආධුනික/ වෘත්තීන් වල නිරතවන්නන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන.

අස්වැසුමලාභී හා සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ පවුල් අතරින් 2025 වර්ෂයේ ක්‍රියාත්මක සවිබල ගැන්වීමේ වැඩසටහනට ඇතුලත් පවුල් වල අවු. 16-45 දක්වා වයස් පරතරයේ පුද්ගලයින් ඉලක්ක කර ඔවුන් රැකියා ගත කිරීමේ අරමුණින් මෙම හැකියා හා කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වෘත්තිය පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කලයුතු අතර මෙම වැඩසටහන යටතේ වයස අවු.60 දක්වා වන ඉලක්කගත පුද්ගලයින්ටද ප්‍රතිලාභ සලසා දිය හැකිය.

මේ යටතේ වෘත්තිය පුහුණු පාඨමාලා කරා යොමුකිරීම මෙන්ම RPL ක්‍රමවේදය යටතේ මේ වනවිටත් අත්දැකීම් සහිත වෘත්තීන්හි නිරතවන්නන් වෙනුවෙන් වෘත්තිය කුසලතා සහතික ලබාගැනීම සඳහාද කටයුතු කල හැකි වේ.

වෘත්තිය පුහුණු වැඩසටහන් සඳහා තෘතියික හා වෘත්තිය පුහුණු කොමිසමේ (TVEC) 2025 වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන තෝරා ගත යුතුවේ.

එක් එක් වෘත්තිය පුහුණු ආයතන වල පාඨමාලා හැදැරීම සඳහා යොමු කරන පුහුණුලාභීන් අඛණ්ඩව හා සාර්ථක ලෙස පාඨමාලා හැදැරීමෙන් අනතුරුව රැකියාගත කිරීමේ කාර්යය හා එම පවුල් සවිබල ගැන්වීමේ කටයුතු ඉදිරියේදී සිදුකල යුතුවේ. ඒ පිළිබඳ පියවරෙන් පියවර අඛණ්ඩව අධීක්ෂණය කිරීම අනිවාර්ය වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරන ලද වෙළඳපොල විශ්ලේෂණය තුලින් හඳුනාගනු ලැබූ විවිධ රැකියා අවස්ථා පිළිබඳ තොරතුරු <u>ඇමුණුම - 05</u> න් දක්වා ඇති අතර, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමුකර මෙම වෘත්තිය පුහුණු වැඩසටහන් සඳහා පුහුණුලාභීන් යොමුකල යුතුවේ. එසේ වුවද එම රැකියා අවස්ථා සඳහා පමණක් කිසිවිටකත් සීමා නොවිය යුතු අතර ,එය හුදෙක් මඟ පෙන්වීමක් පමණි.

ඉහත සඳහන් වැඩසටහන ඔබ දිස්ත්‍රික්කය තුල සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන සීමිත ප්‍රමාණයක් වෙන් කරනු ලබන අතර ,එම මුදල් හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු ණය මේ සඳහා උපයෝගි කර ගත හැකි වේ. වෘත්තිය පුහුණු පාඨමාලාවන් සඳහා පුහුණුලාභීන් යොමු කිරීමේදී පහත සඳහන් පියවරයන් අනුගමනය කිරීම ඉතා වැදගත් වේ.

- මේ වනවිටත් ඔබ දිස්ත්‍රික්කය සඳහා පවුල් සවිබලගැන්වීම වෙනුවෙන් ලබා දී ඇති ඉලක්ක කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.

- පවුල් සංවර්ධන සැලැස්ම තුලින් තෝරාගත් සුදුසු ආධුනිකයින් /වෘත්තින්හි නිරතවන්නන් හඳුනාගැනීම.
- තෝරාගනු ලබන පුහුණුලාභීන් වෘත්තීය පුහුණු ආයතන සඳහා යොමු කිරීමට ප්‍රථම අදාල ආයතන සමඟ සාකච්ඡා කිරීම , සුදුසු පාඨමාලා සඳහා යොමු කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී එකඟතා ගිවිසුම් අත්සන් කිරීම.
- පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම
- ආයතනගත කර පාඨමාලා සඳහා යොමු කිරීම
- නිරන්තර අධීක්ෂණය
- විභාග සඳහා යොමු කිරීම
- පාඨමාලා කාලය අවසන් වූ පසු රැකියාගත කිරීම /ස්වයං රැකියාගත කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දීම හා අවශ්‍ය අවස්ථා වලදී ණය ලබා ගැනීමට අදාල සහය ලබා දීම.
- පසුවිපරම් කිරීම හා තොරතුරු වාර්තාකරණය.

එක් පුහුණුලාභියෙක් වෙනුවෙන් උපරිම පාඨමාලා ගාස්තුව රු.50,000/= ක් වන නමුත් දිස්ත්‍රික් ලේකම්ගේ විශේෂ අවසරය මත එය රු.100,000/= දක්වා වැය කලහැකි වේ.

පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ පුහුණුලාභීන්ගේ තොරතුරු Excel පැතුරුම්පත (Excel Sheet) යොදාගෙන ඇමුණුම- 06 මගින්ද ,මාසික ප්‍රගතිය ඇමුණුම - 07 මගින්ද අලෙවි සංවර්ධන අංශයට ලබා දිය යුතුය.

### 3.ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන.

සමෘද්ධි වැඩසටහන යටතේ මේ වන විට ඔබ දිස්ත්‍රික්කයේ බිහි වී ඇති හොඳම ව්‍යවසායකයින් අතුරින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති බල ප්‍රදේශයෙන් තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කල හැකි අතර, එක් වැඩසටහනක් සඳහා ආහාර, සම්පත් දායක දීමනා සහ ලිපිද්‍රව්‍ය වෙනුවෙන් උපරිම රු.50,000/= ක මුදලක් වැය කල හැක. මෙම වැඩසටහන් වලදී ප්‍රජාමූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන මගින් සහ සමෘද්ධි සුව බොජුන්හල් වලින් ආහාර සපයාගැනීම කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

එක් වැඩසටහනක් සඳහා අවම වශයෙන් ව්‍යවසායකයින් 35 දෙනෙකු සම්බන්ධ කර ගත යුතු අතර, වැඩසටහන පැවැත්වීමෙන් පසුව අවම වශයෙන් අඛණ්ඩව මාස 03 ක මාසික පසු විපරම් කටයුතු සඳහා ද මෙම වෙන් කරනු ලබන මුදල් යොදා ගත යුතුය. මෙම මාස 03 තුල සිදුකරන ලද පසුවිපරම පිළිබඳ ප්‍රගතිය එම මාස 03 තුලදී වෙන් වෙන් වශයෙන් Excel පැතුරුම්පත (Excel Sheet) යොදාගෙන ඇමුණුම - 08 මගින් මාසිකව ලබා දිය යුතු වේ. මෙම වැඩසටහනේ මාසික ප්‍රගතිය ඇමුණුම - 04 මගින් මාසිකව ලබා දිය යුතුවේ.

පුහුණුව සඳහා මුද්‍රිත හා මුද්‍රිත නොවන ලිපිද්‍රව්‍ය සපයා ගත යුතු වේ. මේ වන විටත් ඔබ දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික සැලැස්ම පිළියෙල කිරීම සඳහා පුහුණුව ලත් පුහුණුකරුවන් පමණක් සම්පත් දායකයින් ලෙස යොදා ගත යුතු අතර, පුහුණු වැඩසටහනේදී අනිවාර්යයෙන්ම එම ව්‍යවසායකයින් සඳහා වෙන් වෙන්ව ව්‍යාපාරික සැලැස්මක් සකස් කල යුතු වේ. මේ සඳහා සුදුසු පරිදි දින 02 ක පුහුණුවක් සංවිධානය කල යුතුය.

### (4) අස්වැසුමලාභී, සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සුව බොජුන් හල් ස්ථාපිත කිරීම.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය අංශයන්හි ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙසින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති මට්ටමින් දිවයින පුරා සමෘද්ධි සුවබොජුන් හල් ආරම්භ කිරීමට අවශ්‍ය උපදෙස් DSD/HO/06/EP/02/SS/10-2025 හා 2025.03.18 දිනැති ලිපියෙන් ලබා දී ඇත. එසේ වුවද 2025 වර්ෂයේදී කඩිනමින් භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදාගෙන දිවයින පුරා සමෘද්ධි සුවබොජුන් හල් 100 ක් ආරම්භ කිරීමට අවශ්‍ය උපදෙස් ලැබී ඇත. ඔබ දිස්ත්‍රික්කයට වෙන්කර ඇති සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ඇමුණුම - 01 හි දක්වා ඇත. මෙහිදී බොජුන්හල් ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රතිපාදන වෙන් නොවන අතර ජනාකීර්ණ හා ප්‍රධාන මාර්ගයක් ආශ්‍රිතව වාහන නැවැත්වීමේ හා අනෙකුත් පොදු පහසුකම් සහිත ගොඩනැගිල්ලක් හඳුනාගැනීම අවශ්‍ය වේ. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, සමෘද්ධි ප්‍රජාමූල බැංකු

සමිතියට, ප්‍රජාමූල බැංකුවට, වෙනත් රාජ්‍ය ආයතනයකට අයත් ගොඩනැගිල්ලක් හෝ පෞද්ගලික ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබාගැනීම සුදුසු වේ. මේ සඳහා අවශ්‍ය මුදල් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ප්‍රජා මූල සංවිධානයෙන් ලබා ගත හැකිය. එමෙන්ම නාගරික ප්‍රදේශ , දුම්රිය ස්ථාන ,බස් නැවතුම්පල වැනි ජනාකීර්ණ ස්ථාන වල නැවත ඉවත් කල හැකි වන පරිදි (Removable) බොජුන්හල් ඉදිකිරීම සඳහා ද කටයුතු කල හැක.

මෙම ගොඩනැගිල්ල සමෘද්ධි සුව බොජුන්හලක් ලෙස භාවිතා කිරීම සඳහා වූ අත්‍යවශ්‍ය ඉදිකිරීම් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන්නාවූ උපකරණ හා භාණ්ඩ මිලදී ගැනීමට සහ බොජුන්හලේ නාම පුවරුව සඳහාද මෙම වෙන් කරනු ලබන මුදල් වැය කළ හැක. ව්‍යවසායිකාවන් 10 දෙනෙකු සම්බන්ධ වී අලෙවි කටයුතු සිදුකිරීමට හැකි ස්ථානයක් සඳහා උපරිමව රු 1,000,000/=ක ප්‍රතිපාදන වැයකල හැක.

මෙම කාන්තාවන් සඳහා ආහාර පිළියෙල කිරීම හා මෙම බොජුන් හලේ අලෙවි කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වන පුහුණුව සඳහා උපරිමව රු. 40,000/= ක මුදලක් මෙම වෙන් කරන ලද ප්‍රතිපාදන තුළින්ම ලබා ගත යුතු අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මේ සඳහා නිපුණතාවයක් සහිත නිලධාරීන් වෙතින් අදාල න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම කළ යුතු වේ.මෙම ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘතිලාභීන් පිළිබඳ තොරතුරු Excel පැතුරුම්පත (Excel Sheet) යොදාගෙන ඇමුණුම - 09 සහ මාසික ප්‍රගතිය ඇමුණුම - 10 මගින් ලබා දිය යුතුය.

පොදු උපදෙස්

01. අලෙවි සංවර්ධන අංශයට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අස්වැසුම ප්‍රතිලාභ ලබන සියළුම සමාජ කාණ්ඩවලට අයත් පවුල් ,සමෘද්ධි සහනාධාර ලැබූ අඩු ආදායම් ලාභී පවුල් වල මෙම ව්‍යාපෘති සඳහා විභවතාවයක් සහිත පුද්ගලයින් තෝරාගැනීමට කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

02. තෝරාගනු ලබන ව්‍යාපෘතිලාභීන් සහ පුහුණුලාභීන් සියළුදෙනා ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් විය යුතුය.

03. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහය සේවා පද්ධතියට අයත් අනෙකුත් නිලධාරීන්ගේ සහය ලබාගැනීම අනිවාර්ය වේ.

04. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් කටයුතු කල යුතු වේ.

05. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී වැය කරන ලද මුදලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 1% ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා 0.5% ක් සහ ප්‍රධාන කාර්යාලය සඳහා 0.5% ක් වන ආකාරයට පරිපාලන වියදම් වෙන් කිරීම සිදුකර ඇති බැවින් එම මුදල් පරිපාලන වියදම් ලෙසට ලබාගත හැකි වේ. වෙන් කර තිබෙන පරිපාලන මුදලින් 50% ක් දිස්ත්‍රික් ප්‍රතිපාදන සමඟ ලබා දීමට නියමිතය.

06. ලබාදෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන හා අග්‍රිම, 2025.11.30 දිනට පෙර ව්‍යාපෘති සහ අනෙකුත් වැඩසටහන් සඳහා වැයකර අවසන් කල යුතුවේ.

07. 2025 වර්ෂය සඳහා ඔබ දිස්ත්‍රික්කයට වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් 45% ක් පමණ 3 වන කාර්තුව අවසන් වන විට වැය කල යුතු වේ.

08. අවශ්‍ය අවස්ථාවලදී පුහුණුලාභීන් සහ ව්‍යාපෘතිලාභීන් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කල යුතුය.

09. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී (Development Officer), ව්‍යාපෘති කළමනාකරු, ප්‍රජා මූල බැංකු කළමනාකරු හා ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු එකතුව් කොට්ඨාශයේ ආරම්භ කරන ලද වැඩසටහන් සාර්ථකව නියමිත අරමුණු කරා ළඟා වීම පිළිබඳව සාකච්ඡා කිරීම, ගැටළු විසඳීම සඳහා අවශ්‍ය පියවර හා සම්බන්ධීකරණ කටයුතු , පසුවිපරම හා ප්‍රගතිය වාර්තා කිරීම කල යුතුය.

10. මෙහිදී ප්‍රජා මූල සංවිධාන, ප්‍රාදේශීය සංවිධාන නිලධාරීන් ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සක්‍රිය අයුරින් සහභාගී කරගත යුතු අතර, විනිවිදභාවය හා සමාජ විගණනයක් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කල යුතු වේ.

11. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටෙක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරීමටත්, යාවත්කාලීන කිරීමටත් කටයුතු කල යුතු වේ. සෑම මසකම අවසන් දිනට සකස් කරන ලද මාසික

ප්‍රගති වාර්තාව අදාල ඇමුණුම් වලට අනුව එළඹෙන මස 10 වන දිනට පෙරද, අනෙකුත් වාර්තා ඉහතින් සඳහන් කර ඇති පරිදි Excel පැතුරුම්පත (Excel Sheet) මගින්ද **<u>samurdhimarketing@gmail.com හරහා පමණක්</u>** අලෙවි සංවර්ධන අංශය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

12. සියළුම වැඩසටහන් සාර්ථක කරගැනීම සඳහා දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් සහ සියළුම විෂය භාර නිළධාරීන්ගේ නිරන්තර අවධානය හා පසුවිපරම් කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

13. ඉහත සියළු වැඩසටහන් සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු සියළු නිලධාරීන්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර දුරකථන අංක 011-2187547 මගින් හෝ samurdhimarketing@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය මගින් අලෙවි අංශය වෙතින් ලබා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

14. 2025 අලෙවි සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඔබ වෙත දැනටමත් ලබාදී ඇති පහත සඳහන් චක්‍රලේඛ උපදෙස් ද අනුගමනය කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

   I. DSD/HO/08/PM/04/E.Power- 2025 හා 2025.02.11 දිනැතිව නිකුත් කරන ලද සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/01.
   II. DSD/HO/08/PM/04/E.Power- 2025 හා 2025.03.07 දිනැතිව නිකුත් කර ඇති සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/01 ට පළමු එකතුව.
   III. DSD/HO/08/PM/04/E.Power- 2025 හා 2025.05.22 දිනැතිව නිකුත් කර ඇති සමෘද්ධි චක්‍රලේඛ අංක:- 2025/01 ට දෙවන එකතුව.

සි.ඩි.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්:

01. ලේකම්,ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය - කා.දැ.ගැ.පි.
02. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.පි.හා අ.ක.ස.
05. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.පි. හා අ.ක.ස.

සමෘද්ධි අලෙවි සංවර්ධන වැඩසටහන - 2025 භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කිරීම

| දිස්ත්‍රික්කය | වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන | | වෘත්තිය පුහුණු වැඩසටහන | ධාරිතා සංවර්ධන වැඩසටහන | | සුව බොජුන්හල් | | මුළු ප්‍රතිපාදන (රු) |
|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | වෙන්කල මුදල (රු) | වෙන්කල මුදල (රු) | අනුමත සංඛ්‍යාව | වෙන්කල මුදල(රු) | අනුමත සංඛ්‍යාව | වෙන්කල මුදල(රු) | |
| 1)කොළඹ | 243 | 729,000.00 | 8,056,000.00 | 22 | 1,100,000.00 | 4 | 4,000,000.00 | 13,885,000.00 |
| 2)ගම්පහ | 243 | 729,000.00 | 15,948,000.00 | 22 | 1,100,000.00 | 4 | 4,000,000.00 | 21,777,000.00 |
| 3)කළුතර | 238 | 714,000.00 | 10,325,000.00 | 24 | 1,200,000.00 | 4 | 4,000,000.00 | 16,239,000.00 |
| 4)ගාල්ල | 396 | 1,188,000.00 | 12,140,000.00 | 33 | 1,650,000.00 | 6 | 6,000,000.00 | 20,978,000.00 |
| 5)මාතර | 284 | 852,000.00 | 8,807,000.00 | 28 | 1,400,000.00 | 4 | 4,000,000.00 | 15,059,000.00 |
| 6)හම්බන්තොට | 225 | 675,000.00 | 7,776,000.00 | 21 | 1,050,000.00 | 3 | 3,000,000.00 | 12,501,000.00 |
| 7)මහනුවර | 360 | 1,080,000.00 | 16,024,000.00 | 25 | 1,250,000.00 | 6 | 6,000,000.00 | 24,354,000.00 |
| 8)මාතලේ | 206 | 618,000.00 | 7,357,000.00 | 19 | 950,000.00 | 3 | 3,000,000.00 | 11,925,000.00 |
| 9)නුවරඑළිය | 187 | 561,000.00 | 6,628,000.00 | 17 | 850,000.00 | 4 | 4,000,000.00 | 12,039,000.00 |
| 10)කෑගල්ල | 206 | 618,000.00 | 7,735,000.00 | 19 | 950,000.00 | 3 | 3,000,000.00 | 12,303,000.00 |
| 11)රත්නපුර | 313 | 939,000.00 | 7,762,000.00 | 25 | 1,250,000.00 | 5 | 5,000,000.00 | 14,951,000.00 |
| 12)කුරුණෑගල | 539 | 1,617,000.00 | 21,735,000.00 | 42 | 2,100,000.00 | 9 | 9,000,000.00 | 34,452,000.00 |
| 13)පුත්තලම | 268 | 804,000.00 | 7,398,000.00 | 20 | 1,000,000.00 | 3 | 3,000,000.00 | 12,202,000.00 |
| 14)පොළොන්නරුව | 131 | 393,000.00 | 3,982,000.00 | 12 | 600,000.00 | 2 | 2,000,000.00 | 6,975,000.00 |
| 15)අනුරාධපුරය | 388 | 1,164,000.00 | 9,369,000.00 | 30 | 1,500,000.00 | 7 | 7,000,000.00 | 19,033,000.00 |
| 16)බදුල්ල | 257 | 771,000.00 | 7,654,000.00 | 20 | 1,000,000.00 | 5 | 5,000,000.00 | 14,425,000.00 |
| 17)මොණරාගල | 206 | 618,000.00 | 4,306,000.00 | 19 | 950,000.00 | 3 | 3,000,000.00 | 8,874,000.00 |
| 18)අම්පාර | 352 | 1,056,000.00 | 6,790,000.00 | 25 | 1,250,000.00 | 7 | 7,000,000.00 | 16,096,000.00 |
| 19)මඩකලපුව | 246 | 738,000.00 | 4,671,000.00 | 24 | 1,200,000.00 | 4 | 4,000,000.00 | 10,609,000.00 |
| 20)ත්‍රිකුණාමලය | 206 | 618,000.00 | 3,105,000.00 | 19 | 950,000.00 | 3 | 3,000,000.00 | 7,673,000.00 |
| 21)යාපනය | 281 | 843,000.00 | 5,872,000.00 | 19 | 950,000.00 | 4 | 4,000,000.00 | 11,665,000.00 |
| 22)කිලිනොච්චි | 75 | 225,000.00 | 1,282,000.00 | 7 | 350,000.00 | 1 | 1,000,000.00 | 2,857,000.00 |
| 23)මන්නාරම | 92 | 276,000.00 | 2,065,000.00 | 8 | 400,000.00 | 2 | 2,000,000.00 | 4,741,000.00 |
| 24)වව්නියාව | 75 | 225,000.00 | 1,377,000.00 | 7 | 350,000.00 | 2 | 2,000,000.00 | 3,952,000.00 |
| 25)මුලතිව් | 112 | 336,000.00 | 1,836,000.00 | 10 | 500,000.00 | 2 | 2,000,000.00 | 4,672,000.00 |
| එකතුව | 6129 | 18,387,000.00 | 190,000,000.00 | 517 | 25,850,000.00 | 100 | 100,000,000.00 | 334,237,000.00 |

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.**

# වෘත්තීය යතුර

ඔබේ කැමැත්ත මැන ගනිමින් ඔබට ගැලපෙන වෘත්තිය තෝරාගන්න.
ඔබේ වෘත්තිය හෝ අධ්‍යාපන ක්ෂේත්‍රය තෝරාගැනිම ගැලපීමේ ක්‍රියාවලියකි

## ඔබ

ඔබේ අවශ්‍යතාවයන්,හැකියාවන්,අගයන්, දක්ෂතාවයන්,හැකියාවන්, රුචිකත්වයන් හා අභිලාෂයන්

## රැකියාව

ඔබේ අවශ්‍යතාවයන් තෘප්තිමත් කිරිම සඳහා වෘත්තිය ක්ෂේත්‍රයේ ඉල්ලුම හා විභවතාවයන්

වෘත්තීය යතුර මගින් මෙම සැසදීමේ ක්‍රියාවලියේ අභිරහස් දොරටුව විවෘත කළ හැකිය. එය ඔබ වඩාත් තෘප්තිමත් කරන වෘත්තිය හෝ අධ්‍යාපන ක්ෂේත්‍රය හඳුනා ගන්නේ

කෙසේද යන්න පෙන්වා දෙයි.

ආරම්භ කිරිම සඳහා මීලඟ පිටුව පෙරළන්න.

නම ........................................................ දිනය .........................

Source by the Career Key by Lawrence K'Jones,Ph.D,NCC

කොළඹ විශ්වවිද්‍යාලීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ

ආචාර්ය කීර්ති ප්‍රේමදාස හා අජිත් ජයවර්ධනගේ සැකසුමකි.

ප්‍රජා සවිබලගැන්විමේ වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන

# ඔබ දෙස ඔබම බලන්නේ කෙසේද?

පහත දැක්වෙන සෑම වගන්තියක්ම කියවා එය ඔබව කොපමණ විස්තර කරන්නේදැයි තීරණය කරන්න. ඔබ සම්බන්ධයෙන් එම වගන්තිය වඩාත්ම නිවැරදි නම් ඉදිරිපස දී ඇති ඉරෙහි ''2'' ලියන්න. ඔබ සම්බන්ධයෙන් එම වගන්තිය නිවැරදි නම් ''1'' ලියන්න. වගන්තිය ඔබව විස්තර නොකරයි නම් ''0'' ලියන්න

## R

........ මා සතුන් උපකරණ හෝ යන්ත්‍ර සූත්‍ර සමග වැඩ කිරීමට කැමතියි.

........ මාගේ වයසේ අනෙක් අය සමග සසඳන විට මට උපකරණ, යන්ත්‍ර සූත්‍ර හෝ සතුන් සමග වැඩ කිරීමේ හා යාන්ත්‍රික ඇඳීම් ආදියේ ඉහළ හැකියාවක් ඇත.

........ මම ප්‍රායෝගික දේ අගය කරමි. දැකිය හැකි, ස්පර්ශ කළ හැකි ගස්වැල් හා සතුන් හදා වඩා ගන්නටත් වඩා හොඳින් සාදන්නටත් කැමැත්තෙමි.

........ මා ප්‍රායෝගික, යාන්ත්‍රික දේට කැමති අතර යථාර්ථවාදී අයෙකි.

........ එළිමහනේ කරන ක්‍රීඩාවලට ඉහළ හැකියාවක් මට ඇත.

## I

........ මා ගණිත හෝ විද්‍යා ගැටලු ඉගෙන ගැනීමට හා විසඳීමට කැමතියි.

........ මාගේ වයසේ අනෙක් අයට සාපේක්ෂව මට ගණිත ගැටලු අවබෝධ කරගැනීමේ හා ඒවා විසඳීමේ ඉහළ හැකියාවක් ඇත.

........ මා විද්‍යාව අගය කරනවා.

........ මා සූක්ෂම,විද්‍යාත්මක හා බුද්ධිමත් අයෙකි.

........ අධිකරණ වෛද්‍ය විද්‍යාව හා බැඳුනු රහස් පරීක්ෂක කතා කියවීමට හෝ එවැනි චිත්‍රපට නැරඹීමට දැඩි කැමැත්තක් මට ඇත.

## A

........ මා චිත්‍ර, නාට්‍ය, කලා ශිල්ප, නැටුම්, සංගීතය හෝ නිර්මාණාත්මක ලේඛනය වැනි නිර්මාණශීලි දේ කිරීමට කැමතියි.

........ මාගේ වයසේ අනෙක් අයට සාපේක්ෂව නිර්මාණාත්මක ලේඛනය, නාට්‍ය, කලා ශිල්ප, සංගීතය, චිත්‍ර වැනි ක්ෂේත්‍රයන්හි ඉහළ කුසලතාවක් මට ඇත.

........ නිර්මාණශීලි ලේඛකයන් අතරින් බිහි වූ නාට්‍ය සංගීත, චිත්‍ර වැනි නිර්මාණාත්මක කලා කටයුතු මම අගය කරමි.

........ මා ප්‍රතිභා සම්පන්න, කලාත්මක, පරිකල්පනාත්මක හැකියාවක් ඇති අයෙකි.

........ පරිගණක ඇසුරින් කරන ඇඳීම් හා ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ කිරීමට මා තුළ ඉහළ කැමැත්තක් ඇත.

## S

........ ඉගැන්වීම, ප්‍රථමාධාර දීම, තොරතුරු සපයා දීම වැනි මිනිසුන්ට උදව් කළ හැකි දේ කිරීමට මා කැමතියි.

........ මාගේ වයසේ අනෙක් අයට සාපේක්ෂව මා ඉගැන්වීම, උපදේශනය, උපස්ථානය හෝ තොරතුරු සැපයීම වැනි ක්ෂේත්‍රයන්හි විශේෂ දක්ෂතාවයක් දක්වයි.

........ මම මිනිසුන්ට උදව් කිරීම හා සමාජ ප්‍රශ්න විසඳීම අගය කොට සලකමි.

........ මා අන්‍යයන්ට උපකාර වන මිත්‍රශීලී හා විශ්වාසවන්ත අයෙකි.

........ සමිති සමාගම් ආදියෙහි ක්‍රියාකාරී සාමාජිකත්වය ලබාගෙන කණ්ඩායම් සමග කටයුතු කිරීමේ කැමැත්තක් මට ඇත.

## E

........ මා මිනිසුන්ට නායකත්වය දීමටත් ඔවුන්ව මෙහෙයවීමටත් අදහස් හා දේවල් විකිණීමටත් ඉහළ හැකියාවෙන් යුතු අයෙකි.

........ මගේ වයසේ අනිත් අය සමඟ සසඳන විට මම මිනිසුන් පාලනය කිරීමේ සහ අදහස් සහ දේවල් ඒත්තු ගැන්වීමටත් ඉහළ හැකියාවක් ඇති අයෙකි.

........ දේශපාලනය, නායකත්වය හා ව්‍යාපාර මම අගයමි.

........ මා උද්‍යෝගිමත්, අධිෂ්ඨානශීලි හා සමාජශීලි අයෙකි.

........ මගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි කැමැත්තක් මට ඇත.

## C

........ මම ක්‍රමානුකූල සංඛ්‍යා, වාර්තා හෝ යන්ත්‍ර සූත්‍ර සමග වැඩ කිරීමට කැමැත්තෙමි.

........ මගේ වයසේ අනිත් අය සමග සසඳන විට මම පිළිවෙලට හා ක්‍රමානුකූලව, සංඛ්‍යා, ලිඛිත වාර්තා සමග වැඩ කිරීමේ ඉහළ මට්ටමක සිටිමි.

........ ව්‍යාපාර මගින් සාර්ථක වීම මම අගය කරමි.

........ මා ක්‍රමානුකූල මෙන්ම සැලසුම් කළ දෙය හොඳින් කිරීමේ හැකියාවෙන් යුක්ත අයෙකි.

........ දිගු වේලාවක් එක් ස්ථානයක රැඳී සිටිමින් නුවණකලාව ලියකියවිලි පරීක්ෂා කිරීමේ හා සටහන් තැබීමේ ඉහළ හැකියාවක් මට ඇත.

දැන් ඔබ ''R,I ,A,S,E'' සහ ''C'' හි වගන්ති සඳහා ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන වෙනම එකතු කරන්න. පසුව, මීළඟ පිටුවේ ඇති ''පේළි 1'' හි ''R'' යටතේ ලියන්න. ''I,A,S,E'' සහ ''C'' සඳහාද එසේම කරන්න.

පහත දක්වා ඇති රැකියා ලැයිස්තුවේ ඔබට කුමන ආකාරයකින් හෝ පැහැදිලිවම ප්‍රයෝජනවත් වන හෝ සිත් බැඳගන්නා රැකියාවන් ඉදිරියෙන් ''2'' යොදන්න. ඔබට ප්‍රයෝජනවත් වේ යැයි සිතෙන ඒවා ඉදිරියෙන් ''1'' ලියන්න. ඔබට තීරණයක් ගත නොහැකි, ඔබ අකමැති වේ යැයි සිතෙන ඔබට ප්‍රයෝජනයක් නොමැති ඒවා ඉදිරියෙන් ''0'' ලියන්න.

| | | |
|---|---|---|
| R......... වායු සමන යන්ත්‍ර කාර්මික ශිල්පී<br>Air Condition Technician | R.........මෝටර් රථ කාර්මික ශිල්පී<br>Auto-mobile Technician | R.........හරිතාගාර ගොවියා<br>Greenhouse Farmer |
| A......... පුවත්පත් ලේඛක<br>Newspaper Writer | A.........සංගීතඥ<br>Musician | A.........චිත්‍ර ශිල්පී<br>Artist |
| E......... වෙළඳ කළමනාකරු<br>Sales Manager | E.........රූපවාහිනී/ගුවන් විදුලි නිවේදක<br>Radio/TV Presenter | E.........ව්‍යාපෘති කළමනාකරු<br>Project Manager |
| C......... පරිගණක දත්ත ක්‍රියාකරු<br>Data Entry Operator | C.........පරිපාලන නිලධාරී<br>Administrative Officer | C.........වාණිජ ගුරුවරයා<br>Commerce Teacher |
| I......... ජීව විද්‍යාඥ<br>Biologist | I......... විද්‍යාගාර තාක්ෂණ ශිල්පී<br>Laboratory Technician | I......... ඖෂධවේදී<br>Pharmacist |
| S......... කථන චිකිත්සක<br>Speech Therapist | S.........ආපදා කළමනාකරණ නිලධාරී<br>Disaster Management Officer | S.........ළමා ආරක්ෂක නිලධාරී<br>Child Protection Officer |
| E......... අවන්හල් කළමනාකරු<br>Restaurant Manager | E.........මංගල උත්සව සැලසුම්කරු<br>Wedding Planner | E.........නීතිඥයා<br>Lawyer |
| R......... එක්ස්කැවේටර් ක්‍රියාකරු<br>Excavator Operator | R.........කුරියර්/බෙදාහැරීමේ රියදුරු<br>Courier/Delivery Driver | R.........ඩ්‍රෝන ක්‍රියාකරු<br>Drone Operator |
| I......... විදුලි ඉංජිනේරු<br>Electrical Engineer | I......... පරිසර විද්‍යාඥ<br>Environmental Scientist | I......... සංඛ්‍යාලේඛනඥ<br>Statistician |
| A......... නළු/නිළි<br>Actor/Actress | A.........මෝස්තර නිර්මාණකරු<br>Fashion Designer | A.........නැටුම් ශිල්පී<br>Dancer |
| C......... මූල්‍ය විශ්ලේෂක<br>Financial Analyst | C.........ගබඩා පාලක<br>Store Keeper | C.........ගිණුම් ලිපිකරු<br>Accounts Clerk |
| S......... පුස්තකාලයාධිපති<br>Librarian | S.........මානව සම්පත් කළමනාකරු<br>Human Resource Manager | S.........මනෝ උපදේශක<br>Psycological Counsellor |
| A......... ගායක<br>Singer | I......... රසායන තාක්ෂණ ශිල්පී<br>Chemical Technician | A.........ත්‍රිමාණ නිර්මාණකරු<br>3D Animator |
| E......... රක්ෂණ වෙළඳ නියෝජිත<br>Insurance Sales Agent | C.........බදු නිලධාරී<br>Tax Officer | E.........මහජන සම්බන්ධතා නිලධාරී<br>Public Relations Officer |
| I......... පර්යේෂණාත්මක විද්‍යාඥ<br>Research Scientist | R.........පෑස්සුම් ශිල්පී<br>Welder | R.........යාන්ත්‍රික ඉංජිනේරු<br>Mechanical Engineer |
| S......... කථිකාචාර්ය<br>Lecturer | S.........සාත්තු සේවිකා<br>Care Giver | C.........නීති ලේකම්<br>Legal Secretary |


සෑම රැකියාවක්ම වම් පැත්තේ ඔබට ''R,I,A,S,E'' හෝ ''C'' යන අකුරු දැකිය හැක. පරිස්සමින් ''R'' අකුර යටතේ වන රැකියාවන් සඳහා ඔබ ලබාගත් ලකුණු එකතු කර එම එකතුව පසු පිටෙහි දක්වා ඇති ''පේළි 2'' හි ලියන්න. අනතුරුව ''I,A,S,E'' සහ ''C'' සඳහාද එසේ කරන්න. අවසානයට ''පේළි 1'' සහ ''පේළි 2'' එකතු කර ''පේළි 3'' හි මුළු එකතුව දමන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පේළි 1 | --- R | --- I | --- A | --- S | --- E | --- C |
| + | | | | | | |
| පේළි 2 | --- R | --- I | --- A | --- S | --- E | --- C |
| = | | | | | | |
| පේළි 3 | --- R | --- I | --- A | --- S | --- E | --- C |

ඔබේ "පේළි 3" සඳහා ඔබට ලැබුණු මුළු එකතුව පහත දක්වා ඇති වෘත්තිය යතුර සඳහා භාවිතා කරන්න.

## ඔබේ වෘත්තීය යතුර

දැන් ඔබේ වෘත්තිය යතුර සෑදීමට සූදානම් ය. ඉහතින් ඇති "පේළි 3" හි "R" සඳහා ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයෙන් ආරම්භ කරන්න. "R" සඳහා ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයට කුඩා "x" (කතිර) ලකුණක් යොදන්න. ඉතිරි අකුරු සඳහාද මෙය කරන්න. මෙය කළ වහාම ඔබ "x" (කතිර) යා කරමින් ඉරක් අඳින්න. මෙය ඔබේ වෘත්තිය යතුරයි.




වෘත්තිය උපදේශකගේ සටහන්:

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

ඇමුණුම - 03

වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහනෙහි ප්‍රතිඵලය වාර්තා කිරීම.

* (Excel පැතුරුම්පත (Excel Sheet)යොදාගෙන ලබාදිය යුතු වේ.)

දිස්ත්‍රික්කය :-

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-

| අනු අංකය | නම | ජා.හැ.අංකය | දුරකථන අංකය | RIASEC - වෘත්තීය යතුර ප්‍රතිඵලය | | | | | | උපදේශකවරයා ගත් තීරණ | | | | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | R | I | A | S | E | C | අධ්‍යාපන | වෘත්තීය අධ්‍යාපනය | රැකියා | ව්‍යවසායකත්වය | RPL | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කලේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

ඇමුණුම - 04

වාවසායකයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන /ධාරිතා සංවර්ධන වැඩසටහන

මාසික ප්‍රගතිය.     දින සිට .......දින දක්වා........

දිස්ත්‍රික්කය :-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | | | | ධාරිතා සංවර්ධන වැඩසටහන් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පැවැත්වූ වැඩසටහන් ගණන | | දරන ලද වියදම (රුපියල්) | | පැවැත්වූ වැඩසටහන් ගණන | | දරන ලද වියදම (රුපියල්) | |
| | | මාසික | සමුච්චිත | මාසික | සමුච්චිත | මාසික | සමුච්චිත | මාසික | සමුච්චිත |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | එකතුව | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කලේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

**අස්වැසුම ප්‍රතිලාභි යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබන පවුල් හා අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන් ඉලක්ක කර වෘත්තීය පුහුණුව ලබාදී රැකියා ගත්වා සවිබල ගැන්වීමට අපේක්ෂිත පවුල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු - 2025**

| අනු අංක | රැකියා මාර්ග | පුහුණුව සඳහා වන පාඨමාලා කාලය | පාඨමාලාව සඳහා වන වියදම රු. | පැවැත්වෙන ස්ථානය | සවිබල අපේක්ෂිත පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1 | ත්‍රිරෝද රථ අලුත්වැඩියාව | අවු.01 | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 1200 |
| 2 | AC කාර්මික ශිල්පී | අවු.01 | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 450 |
| 3 | ශීතකරණ හා වායු සමීකරණ (විශේෂ පුහුණු ) | අවු 01 | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 400 |
| 4 | ඇලුමිනියම් නිෂ්පාදනය | මාස 06 | 15,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 200 |
| 5 | බේකරි නිෂ්පාදනය | මාස 06 | 41,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1500 |
| 6 | බතික් | මාස 06 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 400 |
| 7 | රූපලාවන්‍ය | මාස 06 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 3000 |
| 8 | බයිසිකල් අලුත්වැඩියා කිරීම | මාස 06 | 16,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 2000 |
| 9 | Bites නිෂ්පාදනය | අවු 01 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 2000 |
| 10 | උපස්ථායක සේවා(Care Giver) | පැය 500 | 25,000.00 | ජාතික වෘත්තීය පුහුණු ආයතනය / VTA | 2000 |
| 11 | ආහාර සැපයුම් සේවාව | මාස 06 | 41,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 4000 |
| 12 | සූපවේදියා | පැය 100 | 47,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1000 |
| 13 | හෙද සහකාර | මාස 09 - 12 | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 2000 |
| 14 | කාමර සහායක (හෝටල්) | මාස 03 | 10,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 500 |
| 15 | සංචාරක මාර්ගෝපදේශකයින් | මාස 06 | 13,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 500 |
| 16 | පොල්තෙල් නිෂ්පාදනය | දින 01 | නොමිලේ | විද්‍යාත මධ්‍යස්ථානය | 1000 |
| 17 | අපද්‍රව්‍ය එකතු කිරීම (ප්ලාස්ටික් හා පොලිතින්, බෝතල්, ස්ක්‍රැප් යකඩ, පොල් රාක්ක, කඩදාසි ආදිය) | මේ සඳහා විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවේ. | | | 300 |
| 18 | පරිගණක, සීසීටීවී සහ සූර්ය පැනල ස්ථාපනය සහ සේවා | මාස 06 | 24,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන- VTA | 2000 |
| 19 | විදුලි කාර්මිකයා | මාස 06 | 12,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 2500 |
| 20 | විදුලි කාර්මික ශිල්පී (විශේෂ පුහුණුව) | අවු 01 | 1,000.00 | ජර්මන් ටෙක් (කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය) | 100 |
| 21 | විදුලි රැහැන් ඇදීම | මාස 09 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 4000 |
| 22 | මාළු දැල් විවීම | මාස 06 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 300 |

| අනු අංක | රැකියා මාර්ග | පුහුණුව සඳහා වන පාඨමාලා කාලය | පාඨමාලාව සඳහා වන වියදම රු. | පැවැත්වෙන ස්ථානය | සමස්ත අපේක්ෂිත පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 23 | ග්‍රැෆික් නිර්මාණකරු | මාස 06 | 24,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන- VTA | 400 |
| 24 | කරණවැමි(සැලූන්) | පැය 30 - 100 | 37,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 2000 |
| 25 | අත්කම් නිර්මාණකරණය | මාස 06 | 22,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1300 |
| 26 | * බර වාහන රියදුරු | මාස 1 - 1/2 | 45,000.00 | හයිටෙක් ලංකා ආයතනය - මාවතගම (037-2297999) 777851111 | 500 |
| 27 | බර වාහන අලුත්වැඩියාව | මාස 18 | 56,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1000 |
| 28 | යකඩ වැඩ | මාස 06 | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 2750 |
| 29 | පුකි මැෂින් අලුත්වැඩියාව | මාස 06 | 15,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 500 |
| 30 | කිතුල් ආශ්‍රිත නිෂ්පාදන (කිතුල් පැණි, සහ හකුරු) | මාස 03 (3 මට්ටම) | 1,000.00 | ආයතනගත කර පුහුණුව ලබා දේ. - NAITA | 100 |
| 31 | මේසන් | මාස 03 (3 මට්ටම) | 2,100.00 | වෘත්තීය පුහුණු අධිකාරිය | 3300 |
| 32 | ජංගම දුරකථන අලුත්වැඩියාව | පැය 100 | 13,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 2000 |
| 33 | මෝටර් කාර්මිකයා | මාස 06 | 13,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1000 |
| 34 | වාහන පින්තාරු කිරීම | අවු 01 මාස 06 | 30,000.00 | ජපන් ටෙක් ආයතනය | 300 |
| 35 | ජලනල කාර්මික ශිල්පී | අවු 02 | 60,000.00 | ජර්මන් ටෙක් (කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය) | 600 |
| 36 | විකුණුම් සහකාර ( අබාන්ස්, ෆුඩ්සිටි ) | මාස 03 | 25,000.00 | ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය | 100 |
| 37 | සපත්තු සෑදීම | මාස 06 | 12,000.00 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 500 |
| 38 | ඇඳුම් මැසීම | මාස 06 | 13,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 1500 |
| 39 | වාහන නඩත්තුව (කුෂන් කිරීම/පින්තාරු කිරීම/අලුත්වැඩියා කිරීම) | මාස 06 | 15,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන- VTA | 100 |
| 40 | වාහන ටින්කරින් කිරීම | අවු 01 මාස 06 | 30,000.00 | ජපන් ටෙක් ආයතනය | 100 |
| 41 | වෙල්ඩින් | මාස 06 | 10,000.00 | දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන - VTA | 500 |
| 42 | වෙල්ඩින් (විශේෂ පුහුණුව) | අවු 03 | 150,000.00 | ජර්මන් ටෙක් (කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය) | 100 |
| | | | | එකතුව | 50000 |

ඇමුණුම - 06

රැකියා ඉලක්ක කරගත් ආධුනික/ වෘත්තීන් වල නිරතවන්නන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන.

* (Excel පැතුරුම්පත (Excel Sheet)යොදාගෙන ලබාදිය යුතු වේ.)

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රා.ලේ.කො. | ග්‍රා.නි.ව. | අස්වැසුම/සමෘද්ධි ප්‍රතිලාභ ලැබූ අයගේ නම | පුහුණුලාභී යාගේ නම | ලිපිනය | දුරකථන අංකය | තෝරා ගනු ලැබූ වෘත්තීය පුහුණු පාඨමාලාවේ නම | ආයතනයේ නම හා දුරකතන අංකය | පාඨමාලා කාල සීමාව | අවසන් වන දිනය | සමස්ත පාඨමාලා ගාස්තුව | පාඨමාලාව සඳහා වැය කල භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | එකතුව | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කලේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

ඇමුණුම - 07

රැකියා ඉලක්ක කරගත් ආධුනික/ වෘත්තීන් වල නිරතවන්නන් සඳහා වන වෘත්තීය පුහුණු වැඩසටහන.

මාසික ප්‍රගතිය. දින සිට .......දින දක්වා........

දිස්ත්‍රික්කය :-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා වෙන් කල මුදල රු. | වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා ඇතුලත් කල සංඛ්‍යාව | | වැය කල මුදල රු | |
|---|---|---|---|---|---|---|
| | | | මාසික | සමුච්චිත | මාසික | සමුච්චිත |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | එකතුව | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කලේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

**වාවසායකත්ව ධාරිතා සංවර්ධන වැඩසටහන**

**ප්‍රගතිය වාර්තා කිරීම. 2025........**

* **(Excel පැතුරුම්පත (Excel Sheet)යොදාගෙන ලබාදිය යුතු වේ.)**

**දිස්ත්‍රික්කය :-** **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-**

| අනු අංකය | ව්‍යවසායකයාගේ නම | දුරකථන අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | ව්‍යාපාරය ලියාපදිංචි කිරීම (ඇත/නැත) | | ණය මුදලක් ලබා ගැනීම(ඇත/නැත) | | ව්‍යවසායකයාද ඇතුළුව සේවක සංඛ්‍යාව | | ගණුදෙනු සටහන් කිරීම (ඇත/නැත) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පුහුණුවට පෙර | පුහුණුවට පසු | පුහුණුවට පෙර | පුහුණුවට පසු | පුහුණුවට පෙර | පුහුණුවට පසු | පුහුණුවට පෙර | පුහුණුවට පසු |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

** මෙම වාර්තාව මගින් මාස 03 තුලදී වෙන් වෙන් වශයෙන් ප්‍රගතිය ලබා දිය යුතුය.

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.**

**සකස් කලේ:-** **දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

**දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු**

ඇමුණුම - 09

කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සුව බොජුන් හල් ස්ථාපිත කිරීම

* (Excel පැතුරුම්පත (Excel Sheet)යොදාගෙන ලබාදිය යුතු වේ.)

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | බොජුන්හල පිහිටි ස්ථානය | ව්‍යවසායිකාවගේ නම සහ ලිපිනය | දුරකථන අංකය | අලෙවි කරන ආහාර වර්ගය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කළේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු

ඇමුණුම - 10

කාන්තාවන් සඳහා රැකියා අවස්ථා ඇති කිරීම අරමුණු කර ගනිමින් සුව බොජුන් හල් ස්ථාපිත කිරීම
මාසික ප්‍රගතිය. දින සිට .......දින දක්වා........

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අලෙවි කටයුතු කරන සංඛ්‍යාව | දෛනික අය කිරීම් රු. | |
|---|---|---|---|---|
| | | | මාසික | සමුච්චිත |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | එකතුව | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

සකස් කලේ:-

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් අලෙවි විෂයභාර කළමනාකරු